28/06/2011 - ලංකාදීප

**පුළුල් සංවාදයකට යා යුතු බලය බෙදා හැරීමේ යෝජනා - මිලින්ද මොරගොඩ**

දශක තුනක් ශ්‍රී ලාංකික සාමාන්‍ය ජනතාව බරපතල පීඩනයකට ලක්කර තිබුණ ත්‍රස්තවාදය අවසන්ය. රටට ඉතිරි කරන ලද ත්‍රස්තවාදයේ අලාභ හා වේදනාව විශාල එකකි. වසර දෙකක් අවසන් වී තිබේ. සමාජය යළි සාමාන්‍ය ජන ජීවිතයට ඇතුළු වෙමින් සිටී. මේ දිනවල බලය බෙදා හැරීම හා දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම ගැන කතා කරන්නට පටන් ගෙන තිබේ. බලය බෙදීම ඉන්දියානු බලපෑමක් බව ඇතැමෙකු මතු කරන අදහසකි. රජය හා ප්‍රධාන විපක්ෂය බලය බෙදා හැරිය යුතු බව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නා නමුත් එය කරන්නේ කවර ආකාරයකට ද යන්න ගැන නිශ්චිත අදහසක් නැති බව පෙනේ.

බලය බෙදාහැරීම ගැන ජාත්‍යන්තර සමාජයේ විවිධ අත්දැකීම් තිබේ. ඇතැම් රටවල බලය බෙදාහැරීම සාර්ථක වී ඇත. තවත් තැනෙක බලතල විමධ්‍යගත කිරීමෙන් සාර්ථක වී තිබේ. පොදුවේ සලකන විට එහි ඇත්තේ මිශ්‍ර ප්‍රතිඵල බව පෙනේ. බලතල විමධ්‍යගත කිරීමේ මූලික අරමුණ රජයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ බලය හැකිතරම් පහළ එනම් බිම් මට්ටමට පැවරීමයි. එවැන්නක් සාර්ථක විය යුතුය. සමාජයේ පිළිගැනීමට ලක්විය යුතුය. බලතල බෙදා හැරීම යන්නෙන් අදහස් කරන්නේ අවශ්‍ය පරිදි ප්‍රතිපත්ති තීන්දු ගැනීම දක්වා බලතල පහල ඒකක වලට පිරිනැමීමයි. පහසුවෙන් එදිනෙදා රාජකාරි ඉටු කර ගැනීමට බලය බෙදාහැරීම සාධාරණය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල බලය පහලම ඒකකයට පැවරීමෙන් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ඇති කර තිබේ. නමුත් සියලුම අංශවල බලය බෙදාහැරිය යුතු ද යන්න ගැඹුරෙන් විමසා බැලීම අවශ්‍යය.

බලය බෙදාහැරිය යුතු ඇයි? බලය කේන්ද්‍රගතව තිබීමෙන් සමාජයේ යම් කොටසකට අසාධාරණයක් ව ඇතැයි වටහාගෙන ඇති නිසාය. නිසි පරිදි බලතල විමධ්‍යගත කිරීම මගින් සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනයක් අත්විය යුතුය. ගුවන් ගමන් බලපත්‍රයක් ගැනීම, රියැදුරු බලපත්‍රයක් ගැනීම, වැනි දේ අද මහජනතාවට එදිනෙදා අවශ්‍ය දේ අතුරින් කිහිපයකි. කොළඹට බලය කේන්ද්‍රගතව ඇති අවස්ථාවක මෙකී අවශ්‍යතා ඉටු කර ගැනීමට විශාල වෙහෙසක් දරන, කාලයක් ගතවන දේ බව පැහැදිළිය. විමධ්‍යගත කිරීමෙන් පසු එයට වඩා පහසුවෙන් මෙවැනි දේ කරගත හැකි විය යුතුය. රජයේ පරිපාලනය විමධ්‍යගත විය යුතුය. දේශපාලන තලයේ දී බලය ගැන දීර්ඝ විවාද හා තර්ක විතර්ක පවතින නමුත් මහ ආණ්ඩුව සතු බලය බෙදා හැරීමේ දී සලකා බැලිය යුතු මූලික සංකල්පය නම් ජන ජීවිතය පහසු කිරීමයි.

පාසල, රෝහල වැනි මහජනතාවට වැඩි පුර දැනෙන ආයතන වල පරිපාලනය මධ්‍යම රජයෙන් ඉවත්කර පහලම ඒකකයට බලතල පැවරීම මහජනතාවට දැනෙන්නේ කෙසේද? දෙමාපියන් සොයන පාසල ජාතික පාසලයි. පළාත්බද පාසල් වල පහසුකම් හා අධ්‍යාපන මට්ටම ගැන මහජනතාව තෘප්තිමත් නැත. ජාතික රෝහලකින් ප්‍රතිකාර ගත හැක්කේ පළාත් සෞඛ්‍ය සේවාව කරන නිර්දේශයක් අනුව පමණක් වුවහොත් මහජනතාව තෝරා ගන්නේ තුමක් ද?

ශ්‍රී ලංකාවේ පරිපාලනය උදෙසා ව්‍යුහ ගණනාවක් ඇත. මධ්‍යම රජය, පලාත් සභා සහ පළාත් පාලන ආයතන ඒ අතර ප්‍රධානය. දිසාපති හා ප්‍රාදේශීය ලේකම්වරු සමග සම්බන්ධ පරිපාලන සේවාව මෙම ආයතන අතරට සම්බන්ධය. යටත් විජිත යුගයේ දී මෙරට ආණ්ඩුවේ ඒජන්ත ධුරය ඇතිවූ අතර අධිරාජ්‍යවාදීන් රට පාලනය කළේ නිලධාරී පෙළැන්තියක් ඇති කිරීමෙන්ය. ඉහලින් දෙන නියෝග වලට අනුව සේවා ක්‍රියාත්මක වන මෙම නිලධාරී රාමුව ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පැමිණීම සමග දුර්වල කරන ලදී. නිදහසට පසු කාලය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වී මැති ඇමතිවරුන්ගේ බලය වැඩි වන විට නිලධාරී බලය බිඳ වැටුණ අතර ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව හා නිලධාරී පෙළැන්තිය එක සමානව පවත්වාගෙන ගියේය. යුද්ධය පැවති කාලසීමාවේ දී ආරක්ෂක අංශ ශක්තිමත් විය. ඒ පදනම තුළ ශක්තිමත්ව ක්‍රියා කරන ආරක්ෂක අංශ අද මහජනතාව හමුවේ සිය සාර්ථකත්වය පෙන්වයි. බිඳ වැටුණ රාජ්‍ය සේවය යළි නගා සිටුවිය යුතුය. එය කළ හැක්කේ යුද්ධය පැවති අවස්ථාවී තිබුණ ප්‍රමුඛතා වෙනුවට සිවිල් පරිපාලනය යළි ඇති කිරීමට විධිවිධාන යෙදීමෙන්ය.

1987 වසරේ දී ඉන්දු ලංකා ගිවිසුම හා එහි උපදෙස් පරිදි සිදුවූ දහතුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා ක්‍රමය රටට එකතු විය. මෙම පළාත් සභා අපට අනන්‍ය ක්‍රමයක් නොවේ. එය ඉන්දියානු ආකෘතියකි. ඉන්දියාව දැවැන්ත භූමියක්, ආගමික භාෂා හා සංස්කෘතික විවිධත්වයක් ඇති රටකි. තමිල්නාඩුවේ ජනගහනය ශ්‍රී ලංකාව මෙන් තුන් ගුණයකි. ඉන්දියාව එවැනි ප්‍රාන්ත රැසකින් සමන්විතය. මධ්‍යම රජයට පමණක් ඉන්දියාවේ පාලනය පවත්වාගෙන යා නොහැකිය. ඉන්දියාවට ස්වකීය බලය ප්‍රාන්ත මට්ටමට බෙදා විශාල ස්වාධීනත්වයක් පිරිනමන්නට සිදුවූ අතර එසේ නොවුනානම් ඉන්දියාව රටවල් ගණනකට බෙදී වෙන්වීම වැළැක්විය නොහැකිය. මෙරට ජනවර්ග අතර ප්‍රශ්න මතු වූ අවස්ථාවේ දී තමන්ගේ බලය බෙදා හැරීමේ රාමුව ශ්‍රී ලංකාවට ද ගැලපිය හැකි බව ඉන්දීය නායකයෝ කල්පනා කළහ. උතුරේ ප්‍රශ්නයට රට පුරා බලපැවැත්වෙන පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන් නමුත් එය විසඳුමක් වූයේ නැත. යුද විසඳුමකින් ත්‍රස්තවාදය මැඩ පවත්වන්නට රජයට සිදුවිය. පළාත් සභා, යටත් විජිත යුගයේ ඇති කළ දිසාපති පාලනය, නිදහස් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඇතුලු මිශ්‍ර ව්‍යුහයක් රට තුළ අද පවතී.

මේ අනුව වගකීම ඇත්තේ කුමන ආයතනයකටද? ජාතික පාසල් පද්ධතියක් ඇත. පළාත් සභා වලට අයත් පාසල් ද තිබේ. ජාතික පාසල් වලට සම්පත් ඇත. පලාත් මට්ටමේ පාසල් වල ජනප්‍රියත්වය අඩුය. ජාතික පාසල්වල ගොඩනැගිලි, ගුරුවරු සහ බාහිර ක්‍රියාකාරකම් එමටය. දෙමව්පියන්ගේ උපරිම උත්සාහය තම දරුවා ජාතික පාසලකට ඇතුළු කිරීමටය. නොයෙකුත් අක්‍රමිකතා සහ දූෂණ ඒ වටා ඇති වී තිබේ. පලාත් සභා වලින් පාලනය වන පාසල් වලට සම්පත් අඩුය. ගුරුවරුන් ප්‍රමාණවත් නැත. රටට අවශ්‍ය ජාතික පාසල් ද, පලාත් සභා යටතේ පාලනය වන පාසල් පද්ධතියක්ද? ආරෝග්‍ය ශාලාවේ තත්ත්වය ද එයමය. ජාතික හා පලාත් මඟී ප්‍රවාහනය අතර ප්‍රශ්න තිබේ. මහජනතාවට එක තැනකින් විසඳා ගත හැකිව තිබුණ ප්‍රශ්නයකට තැනින් තැනට යන්නට සිදුව තිබේ. ගුරුවරුන්ගේ ස්ථාන මාරුවක්, විශ්‍රාම වැටුප් ප්‍රශ්නයක් පළාත් අමාත්‍යංශය හා අධ්‍යාපන අමාත්‍යංශය අතර ප්‍රතිපත්ති තීරණ අතර ගැටේ. ජාතික මාර්ග පද්ධතිය හා පළාත් සභා මාර්ග නඩත්තුව අතර ගැටලුය. ගොවීන්ට ඇති වාරිමාර්ග ගැටලුවක් අවසානයේ දී විසඳාගත හැකි වන්නේ දිසාපති කාර්යාලය හරහාය. පලාත් සභා ක්‍රමය අසාර්ථක බව මහජනතාව සිතන්නට පටන් ගෙන තිබේ. පලාත් සභා සුදු අලි බව චෝදනා නැගෙයි. පළාත් සභාවේ සිටින අය විශ්වාස කරන්නේ තමන්ට වැඩ කරන්නට අවශ්‍ය තරමට බලතල ලැබී නැති බවය. ප්‍රශ්නයක් විසඳීමට ඇති කළ ව්‍යුහයක් පැවති රාමුවට බද්ධ කිරීමට ප්‍රයත්න දැරීමේ දී ඇති කර තිබෙන විවිධ ගැටලුවල නොයෙක් පැති ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට බලය බෙදා හැරීම අවශ්‍යද? බලය බෙදා හැරීම අවශ්‍යනම් එය කරන්නේ කෙසේද? අප අතර පුළුල් විද්වත් සාකච්ඡාවක් පවත්වා ගැනීම අවශ්‍යය. ප්‍රශ්නයට සැබෑ විසඳුමක් සැපයිය හැක්කේ යථාර්ථය හඳුනා ගැනීමෙන් පමණකි. යාපනයේ වෙසෙන ජනතාවට තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය පරිපාලන ආයතනය කුමක්ද? ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවල තීන්දු ගත යුත්තේ යාපනයේ ද? කොළඹ ද? හම්බන්තොට වෙසෙන පුද්ගලයෙකුට ස්වකීය අවශ්‍යතා වෙනුවෙන් කොළඹට පැමිණිය යුතුද? මහජනතාවට තමන් පදිංචි පලාතේ දී එදිනෙදා අවශ්‍ය උවමනා එපාකම් සපුරා ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම, බලතල බෙදා හැරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන ම කාරණයයි. එය කළ යුතු භූමිය අනුව පමණක් නොවේ. භාෂාව ද ප්‍රධාන සාධකයකි. සංස්කෘතිය ද නොසලකා හැරිය නොහැකිය. බලතල බෙදා දිය යුතු කවර අංශ වලදැයි තීරණයකට ද පැමිණිය යුතුය. උතුරු පලාතට බලතල බෙදන විට නැගෙනහිර පළාතේ වෙසෙන ප්‍රධාන ජාතීන් තුනම නියෝජනය කරන මහජන අවශ්‍යතා අතර පරස්පරයක් තිබිය හැකිය. බලතල බෙදා හැරීම ගැන අවධානය යොමු කරන අතර බෙදා දිය යුතු බලතල මොනවාදැයි තීරණය කිරීමට අමතරව මෙම බෙදා හැරීමේ ගමන්මග ගැන මහජනතාව විශ්වාසයක් ඇති කිරීම අවශ්‍යය. එය කළ හැක්කේ මහජනතාව තුළ බලතල බෙදා හැරීම ගැන පවතින අදහස් විශ්ලේශනය කර නව සැලසුම් සකස් කිරීමෙනි. පලාත් සභා සම්බන්ධයෙන් රටට අත්දැකීම් තිබේ. එය ක්‍රියාත්මක වූ කාලයේ රටට ලැබුණ වාසි අවාසි විශේෂයෙන් අධ්‍යයනය කළ හැකිය. එහි දුර්වලතා සහ වැඩි දියුණු කළ යුතු පැති අනාවරණය කර ගත හැකිය. අප බලය බෙදා හැරීම ප්‍රතික්ෂේප කළ රටක් නොවේ. මෑත ඉතිහාසයේ පලාත් සභා ක්‍රමය අනුව බලතල බෙදා හරින

ලද නමුත් අධිරාජ්‍යවාදීන්ට යටත් වීමට පෙර මෙරට රුහුණු, පිහිටි හා මායා වශයෙන් එක රටක් තුළ බලය බෙදුනු අන්දමත්, ප්‍රාදේශීය රජවරු හා ප්‍රදේශාධිපතීන් සිටි බවටත් සාක්ෂි ඇත. මේ පැති අධ්‍යයනය කර රටට ගැලපෙන බලතල බෙදාහැරීමේ ක්‍රමවේදයක් දින වකවානු සහිත මාර්ග සිතියමක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය. එසේ කිරීමෙන් වැඩ පිළිවෙල ගැන විශ්වාසය තහවුරුවෙයි. බෙදාහරින බලතල කවරේ ද හා එය බලපවත්වන්නට යෝජිත වකවානු ප්‍රකාශයට පත්වූ විට රටවැසියන් තුළ මෙම ක්‍රියාදාමය ගැන බලාපොරොත්තුවක් ඇතිවෙයි. පොලිස් හා ඉඩම් බලතල පලාත් මට්ටමට දිය කළ යුතු බව කියයි. පොලිසිය කරන්නේ අපරාධ මර්දනයයි. දැනටත් අපරාධ වැඩිය. සමාජය සංකීර්ණය. පලාත් මට්ටමට පොලිසියේ බලතල බෙදීමෙන් අපරාධ අඩු කර ගත හැකිද? ඉඩමේ අයිතිය තීරණය කිරීම පලාත් සභාවට පමණක් පැවරීම ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට ගැලපෙන ප්‍රතිපත්තියක්ද? ඉඩම් අයිතිය මහ ආණ්ඩුවට හා පළාත් ආණ්ඩුවට යම් ප්‍රමිතියකට අනුව පවත්වාගෙන යා හැකිය. මේවා සාකච්ඡා කළ යුතුය.

ත්‍රස්තවාදය මැඩ පවත්වා වසර දෙකක් ගත කර තිබේ. ජාත්‍යන්තර සමාජය මහජනතාව වෙනුවෙන් ගන්නා අලුත් වැඩ පිළිවෙල ගැන උනන්දුවෙන් බලා සිටී. බලතල බෙදීමෙන් මහජනතාවගේ අවශ්‍යතා සපිරෙන තෙක් ඔවුහු බලා සිටිති. ජාත්‍යන්තර මතය අනුව යමින් පමණක් බලතල වහාම බෙදා හැරීම ද අපහසුය. බලතල බෙදා හැරීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය අපට ද ඇත. පළාත් සභාව හෝ පිහිටුවන යම් පරිපාලන රාමුවකට නීත්‍යානුකූලව බලය ලබා දෙන්නට කලින් එකී ආයතන තමන්ට හිමිවන බලය අනුව ක්‍රියා කරන්නට ශක්තිමත් ව්‍යුහයක් සහිත ද යන්න සොයා බැලිය යුතුය. බලය ඇති ආයතන මානව සම්පත් හා මුදල් නොමැතිකම නිසා මහජනතාව අසරණ කරන අවස්ථා අපට පෙනේ. මොනරාගල දිස්ත්‍රික්කයට බලය ලැබුණත් එම කාර්යාල වල පහසුකම් වැඩි දියුණු වන්නේ නැතිනම් මහජනතාව පත්වන්නේ අතෘප්තියටය. බලය බෙදාහැරීමේ යාන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාත්මක නොවේ. හිමිවන බලය අනුව වැඩ කරන ආයතන සහිත පරිසරයක් කෙරෙහි ද පළමුවෙන් අවධානය යොමු කිරීම අවශ්‍යය.

පවතින ක්‍රමයට එරෙහි වූයේ එහි අසාර්ථකත්වය නිසාය. විධායක ක්‍රමයද? පළාත් සභා ද, එසේ නැතිනම් පළාත් පාලන ආයතන ශක්තිමත් කරනවාද? රාජ්‍ය පරිපාලනය දිසාපති මට්ටමේ පවත්වාගෙන යනවාද යන්න ගැන අවංකව අවධානය යොමු කර එකඟතාවයකට පැමිණීම අද ඇති අභියෝගයයි. ඉන්දියාවේ පංචායත් ක්‍රමය ගැන අවධානය යොමු කර ඇත. ජනසභා ගැන රජය උනන්දුය. මේ ආයතන පිහිටුවිය හැකි නමුත් මේවා සාර්ථකව පවත්වාගෙන යන්නට අවශ්‍ය ධනය හා මානව සම්පත් සොයා ගැනීමත් ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට දුෂ්කර බව තේරුම්ගත යුතුය. ලෝකයේ වෙනත් තැනෙක සාර්ථක වී ඇති ක්‍රමයක් අපේ රටට නොගැලපේ. මෙරට සංස්කෘතිය, අනන්‍යතාව අනුව අලුත් ව්‍යුහයක් ගැන විමසා බැලිය හැකිය.

බලය බෙදා හැරීම රට තුළ ඇති ප්‍රශ්න වලට විසඳුමක් බව ප්‍රකාශ කළ හැකි නමුත් එහි ආර්ථික යතාර්ථය ද වටහා ගැනීම අවශ්‍යය. මෙරට සියලුම පළාත් ආර්ථික ශක්තිය අතින් එක හා සමාන නැත. බස්නාහිර පලාතේ ආදායම මුලු රටේ ම ආර්ථිකයෙන් හරි අඩකට වඩා විශාලය. සෙසු පලාත් සියල්ල හිමි කරගෙන ඇත්තේ ඉතිරි අඩය. රටේ සියලුම ජනතාවට එක හා සමාන පහසුකම් සපයන්නට නම් පලාත් මට්ටමින් සමාන ආර්ථික ශක්තියක් පැතිර තිබීම අවශ්‍යය. බස්නාහිර පලාතෙන් උපයන ආදායම සෙසු පලාත්වල සංවර්ධනයට යෙදවීම සාධාරණ ද? කෙටි කාලයකට එය කළ හැකිය. සංවර්ධන සැලසුම් පවත්වාගෙන යාමට අඩු ආදායමක් ඇති පලාත්වල වැසියන්ගෙන් වැඩි පුර බදු අයකරන්නට සිදුවිය හැකි අතර එවිට බදු විශමතා ඇතිවෙයි. මේ ගැන ද කල්පනා කිරීම අවශ්‍යය.

බලතල බෙදන කරන දහතුන් වැනි සංශෝධනය ගැන සාකච්ඡා කරන විට එයට එරෙහිව කතා කරන ඇතැමෙකුගේ මතය මෙවැනි බලය බෙදාහැරීමක් දැන් අවශ්‍ය නැති බවයි. ත්‍රස්තවාදය අවසන්ය. රටේ ප්‍රශ්න විසඳීමට ආණ්ඩුවට හැකියාවක් ඇති අතර ඒ වෙනුවෙන් බලපෑම් අවශ්‍ය නැති බව ඔවුන්ගේ අදහසයි. උතුර හා නැගෙනහිර පලාත්වල යුද ගැටුම් පවතින අතරවාරයේ රජය, මහජන අවශ්‍යතා සාක්ෂාත් කරන ලද්දේ දිසාපති ක්‍රමය අනුවය. ආණ්ඩුව ආරක්ෂක අංශ සහාය කරගෙන,

ආණ්ඩුකාර ධුරය හරහා දිසාපති ප්‍රධාන නිලධාරීන් මගින් පාලනය ගෙන ගියේය. පළාත් සභා හා පලාත්පාලන ආයතන අක්‍රීය විය. එල්.ටී.ටී.ඊ සංවිධානය පවා විශ්වාසය තැබුවේ දිසාපති ප්‍රධාන රජයේ පැරණි ව්‍යුහය කෙරෙහි බව අමතක කළ යුතු නැත. බලය බෙදා හැරීමේ යෝජනාව සමග මෙවැනි සියුම් පැති ගැන ද අවධානය යොමු කිරීම වටී.

බලය බෙදා හැරීම පුළුල් විෂයයකි. අධ්‍යාපන, ඉඩම් හා පොලිස් බලතල ගැන කතා කරයි. අවසානයේ දී මෙම විෂයයන් සම්බන්ධයෙන් තීරණ ගත හැකි අලුත් රාමුව මහජනතාවගේ අවශ්‍යතා ඉටුකරන සාධාරණ තැනක් විය යුතුය. ආණ්ඩුවකින් කර ගත නොහැකි වූ දෙයක් තමන්ගේ ගම් පලාතේ දී කරගන්නට රට වැසියන්ට හැකි විය යුතුය. නිලධාරීවාදය, දූෂණ හා අක්‍රමිකතා වලින් තොර බව මහජනතාවට දැනෙන්නට අවශ්‍යය. මහජනතාවගේ පරමාධිපත්‍යය හා රාජ්‍ය පාලනය හා පුරවැසියන් අතර ඇති මහජන සම්මුතියට ගරු කරන වැඩ පිළිවෙලක් වීම අවශ්‍යය. එය පහසු එකක් නොවේ. සීත කාමර වල සිට නීති වෙනස් කළ හැකිය. වගන්ති සංශෝධනය කරන්නට හැකිය. බාහිර රටවල් බලපෑම් කරනු ඇත. යෝජනා ඉදිරිපත් කරනු ඇත. යුද්ධය අවසන් වී අවුරුදු දෙකක් ගත වී ඇති නිසා ඉක්මන් විසඳුමක් ඇති කිරීමට උපදෙස් දෙනු ඇත. රජයට අවංක උවමනාවක් තිබිය හැකි අතර ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ වල ගැටීම්, මතවාද හා අදහස් හුවමාරු අනුව අවසන් තීන්දුව සම්බන්ධ මිශ්‍ර ආකල්ප සහිත වීමට ඉඩ ඇත.

එනමුත් යම් ව්‍යුහාත්මක වෙනසක් රටට අවශ්‍යය. නිදහස ලැබීමෙන් පසු පැවති පරිපාලනයේ ප්‍රශ්න තිබේ. සාමාන්‍ය ජනතාවට එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සපුරා ගන්නට ප්‍රමාණවත් සහය නොලැබේ. නීති හා විධිවිධාන ඇතත් මහජනතාව හිරිහැරයට ලක්වන අවස්ථා ඇත. මූලික අවශ්‍යතාවය මහජනතාවගේ අභිමතාර්ථ සපුරාලීමයි. ව්‍යවස්ථා සංශෝධනය එහි එක කොටසක් පමණකි. බලය බෙදා හැරීම අවශ්‍යය. බලතල බෙදා හැරිය යුතු නිසි පරිදි බලය ක්‍රියාත්මක කරන ආයතනික රාමුවකටය. මහජනතාවගේ උවමනාව තේරුම්ගෙන ඔවුන්ගේ අවශ්‍යතා සපුරන අතර ජනතාවගේ අනාගතය සාක්ෂාත් කරන්නට එයට හැකිවිය යුතුය.

චීන හමුදාවේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වූ Sun Tzu ලියන ලද The Art of War කෘතියේ "Ultimate excellence lies not in winning every battle, but in defeating the enemy without ever fighting. The highest form of warfare is to attack Strategy itself" කියමන එයි. එයට අනුව හැම සටනක්ම ජයග්‍රහනය කිරීම නොව සටනකින් තොරව විජයග්‍රහණය ලැබීම වැදගත්ය. ප්‍රහාරය එල්ල විය යුතු සතුරන්ගේ යුද උපායටය. ශ්‍රී ලංකාවට ද යුද්ධයක් කරන්නට සිදුවිය. දැන් එය අවසන්ය. සැබෑ ජයග්‍රහණයක් වෙනුවෙන් සමාජයේ අසමානතා නැති කළ යුතුය. සාධාරණත්වය හා යුක්ති සහගත බව පැතිරවිය යුතුය. උතුරේ හා දකුණේ වශයෙන් කැරැලි කිහිපයක් රට තුළ ඇතිවිය. සම්පත් බෙදී යාමේ විශමතා හා සමාන අවස්ථා අහිමිවීම මෙම කැරළි වලට පසුබිම විය. මෙම තත්ත්වය තේරුම් නොගෙන ක්‍රියා කළහොත් කොතැන කොයි මොහොතක දී හෝ මීළඟ කැරැල්ල ඇතිවිය හැකිය. මහජනතාවගේ අවශ්‍යතා ඉටුවන පරිදි පහලම ඒකකයට වගකීම් පැවරීම අවශ්‍යය. අසාධාරණය අයුක්තියට එරෙහි විය හැක්කේ සතුරු වෙසින් එන එම යුද උපායයන් හඳුනාගෙන නිශ්චිත ඉලක්කයට පහර දීමෙන්ය. එය යුද්ධ නොකර සංග්‍රාම දිනන කලාවයි.